**දමන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 06 දින ලේකම්වරයාට යවන ලදී.

### 1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹුකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට වටිනාකම ගණනය කල හැකි ප්‍රමාණවත් තොගයක් ගබඩාවේ තිබුණද, එම තොගයේ වටිනාකම ගණනය කර ශේෂ පත්‍රයට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරෙන්තු ගාස්තු ආදායම ලෙජරය අනුව රු.38,548 ක් වුවද, එය ආදායම් වියදම් ගිණුමට රු.26,448 ක් ලෙස ගෙන තිබීම නිසා වර්ෂයේ ආදායම රු.12,100ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජර් ගිණුම අනුව වටිනාකමක් දක්වා නොතිබූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.196,675 ක් ලෙස ශේෂ පත්‍රයට ගෙන තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
-------------------------------------

එකතු වටිනාකම රු.293,319 ක් වූ ගිණුම් විෂයයන් 2 කට අදාල අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්.**

----------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| 150 (4) වගන්තිය | බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැරි අවස්ථාවලදී එම හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව** | |
| (i). රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැරහරින පුද්ගලයින් පිළිබඳව ලැයිස්තුවක් එක් එක් කාර්තුව අවසානයේදී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii). රීති 59 - 66 | කර්මාන්ත බදු අයකල යුතු ආයතන හඳුනාගෙන ඒවා අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii). රීති 153 | ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශයක්, පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |
| **(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 571 | එකතුව රු. 1,638,496 ක වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එන ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2014දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 379,644 ක් වූ අතර,එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.201,337ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.178,307ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------- ---------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

(අ) පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ, වෙනත් ආධාර හා ආදායම් මූලාශ්‍රයන්හි සියයට 17 සිට සියයට 51 දක්වා පරාසයක වර්ධනයක් ද, බදුකුලී ආදායම්, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් මූලාශ්‍රවල සියයට 17 සිට සියයට 46 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි.

(ආ) පුනරාවර්තන වියදම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ගමන් වියදම්, ප්‍රවාහන සම්බන්ධතා, උපයෝගිතා හා වෙනත් සේවා, ආධාර මුදල් දායක මුදල් සහ සහනාධාර යන වියදම් වල සියයට 7 සිට සියයට 85 ක අඩුවීමක්ද,වැටුප් හා දීමනා සියයට 75 දක්වා පරාසයක වැඩිවීමක්ද පෙන්නුම් කරයි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------

(අ) සභාව විසින් 2014 වර්ෂය සඳහා අයවැය අනුමත කර ගැනීමක් සිදුකර නොමැති බැවින් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට සභාව වෙත ලැබිය යුතු සමුච්ත හිඟ ආදායම් රු. 2,254,331 ක් අයකර ගැනීමට කිසිදු නීත්‍යානුකූල පියවරක් ගෙන නොතිබුණි

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.179,283 ක් නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.264,700 ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් රු. 1,960,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර, එම ණය මුදලට අදාල පොලිය සහ වාරික 2006 දෙවන කාර්තුවේ සිට නොගෙවීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ඇති ණය ප්‍රමාණය රු. 1,326,044 ක් හා හිඟ ණය පොලී රු. 412,726 ක් වශයෙන් රු. 1,738,770 ක් ගෙවීමට තිබුණි.

(ආ) කාර්තුමය වශයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට මුද්දර ගාස්තු යැවිය යුතු වුවද, 2014 දෙසැම්බර් 31 දිනට රු. 130,024 ක මුදලක් විගණිත දින වන 2014 අප්‍රේල් 08 දක්වාත් ගෙවීම් නොකර රඳවාගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ යටතේ දක්වා ඇති රු. 18,850 ක් හා කොන්ක්‍රීට් ගල් මිළදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතුරු. 345,000ක මුදලක් 2013 වර්ෂයේ සිට මේ දක්වා නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලබේ.

(අ) සභාව විසින් මෙතෙක් ලබා දී ඇති සේවක ණයවලට අදාල කිසිදු ලිපියක්, ලිපිගොනුවක් අදාල රාජකාරිය පැවරී ඇති නිලධාරීන් භාරයේ නොමැති නිසා ණය සම්බන්ධ විගණන කටයුතු කිරීමට නොහැකි විය.

(ආ) 2013 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව සභාවේ පුස්තකාල 04 කට අයත් අස්ථානගතවූ පොත් 2912 කට අදාල කිසිදු ක්‍රියාමාර්ගයක් කර නොතිබු අතර පාඨකයින්ට බැහැර ගෙනයාමට නිකුත් කරන ලද පොත් 341 ක් පාඨකයින්ගෙන් නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

**-----------------------**

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති 05 ක් සඳහා රු.2,500,000 ක වෙන්කර තිබූ ප්‍රතිපාදනවල වලංගු කාලය 2014 අගෝස්තු 31 වන දිනෙන් අවසන් වැඩ ආරම්භ කිරීමට නොහැකි වූ නිසා 2014 නොවැම්බර් 30 දක්වා කාලය දීර්ඝ කර දී තිබුණ ද විගණිත දිනය වන 2015 ජනවාරි 30 වන තුරු වැඩ ආරම්භ කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන.**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය
**(ආ)** ආදායම් පරිපාලනය
**(ඇ)** වත්කම් කළමනාකරණය